


අපේ ගෙවත්ත ඉතා සුන්දරය. අඹ පේර ජම්බු වැනි ගස් වලින් ගෙවත්ත පිරී ඇත. ගස්වැල්වල පිපුනු මල් ගෙවත්තේ සුන්දරත්වය දෙගුණ තෙගුණ කරයි. එහි ඇති අතු විහිදුනු විශාල අඹ ගස කුරුල්ලන්ට හා ලේනුන්ට අමිල සේවයක් ඉටු කරයි. කුරුල්ලන් වෙනුවෙන් බත් ලෑල්ලක් අඹගස මත තිබේ. අඹ ගසට එන වඳුරෝ අඹ ලෙලි සහ ඇට අපට ඉතුරු කොට පැන යති.
දහවලට කුරුල්ලෝ අඹ අතු අතර සැරිසරති. අඹ අතු නිසා හිරු රශ්මියට සතුන්ගේ පිහාටු මත ගෑවීමට නොහැකිය. අවාසනාවක මහත! සමහර කුරුල්ලන්ට අඹ ගසට පැමිණ තමාගේ කුඩු කරා යාමට අවස්ථාවක් නොලැබේ. ඒ ඔවුන්ට පුසන්ගේ සහ සර්පයෙකුගේ කුස පිරවීමට සිදු වන හෙයිනි.

එදා අපේ ගෙවත්තේ කුරුල්ලන්ගේ මහා ගාලගෝට්ටියකි . කුරුල්ලො "කිචි බීචි'' හඬ දසත පතුරුවති. ලේන්නු ඒ මේ අතට පනිති. දෙමලිච්චා ගේ හඬ අනෙක් හඬවල් පරදවා ඇසෙයි.



"කුරුල්ලන්ට කරදරයක්'' අම්මා කීවාය.

"අම්මා කොහොමද දන්නේ'' මම ඇසුවෙමි.

"සතුන්ට කරදරයක් උනාම බේරාගන්න කියනව වගේ කෑගහනව''අම්මා කීවාය.

මම මිදුලට දිව ගියෙමි.

මා දුටු දර්ශනයෙන් ඇඟේ ලේ වතුර විය. අපේ කිටියා කොබෙයියෙකු කටින් දරාගෙන ආඩම්බරයෙන් මා දෙසට පැමිණියේය. මගේ අත ළඟ තිබූ පොල්ලකට ගියේය. මොහොතකින් පොල්ල කිටියා ගේ පාද සිපගත්තේය. කිටියා පණ එපා කියමින් නිවසට දිව්වේය.

මම ඉක්මණින් කොබෙයියා ළඟට ගියෙමි, කිටියාගේ තියුණු දත් පහරින් කොබෙයියාගේ පාද තුවාල වී තිබිණ. වතුරෙන් තෙමූ රෙදි කැබැල්ලක කොබෙයියා ඔතා අම්මා ළඟට ගෙන ගියෙමි. අම්මා දුන් බෙහෙත් උගේ දෙපා වල ගා ඉදිරිපස කාමරයේ පෙට්ටියකට දැමුවෙමි. උගට කෑමට අඹ කැබැල්ලක් දුන්නෙමි. ජනේලය අසලින් ශබ්දයක් ඇසී මම ඒ දෙස බැලූවෙමි. මට දෑස් අදහාගත නොහැකි විය. කොබෙයියෝ කිහිප දෙනෙක් ජනේලය අසල ඒ මේ අතට පියාඹති. තම මිතුරාට කුමක් සිදුවී ඇද්දැයි බලන්නට ඔවුන්ට සිතෙන්නට ඇත. ඔවුන්ගේ මිතුරු දම කොතරම් බලවත් දැයි මට සිතිණ. තමාගේ වර්ගයේ අයෙකු කරදරේ වැටෙනවාට ඔවුන් කැමති නැත. මිනිසුන් තුළ නැති සතුන් තුළ ඇති යහපත් ගුණාංගයක් මම දුටුවෙමි. ඔවුන් තුළ ඇති සමගිය ගැන මට දැඩි සතුටක් දැනිණ. මම උඟ ලඟින් කිරි කෝප්පයක් තැබුවෙමි.

මම දිවා ආහාරයෙන් පසු කොබෙයියා ලඟට ගියෙමි. උඟ කිරි කෝප්පය බී තිබිණ. මගේ සිතට සතුටක් දැනිණ . අම්මා රෙදි පටියක් ගෙන ඒ අසලට ආවාය . කොබෙයියා අතට ගන්නා ලෙස මට කියූ අම්මා රෙදි පටියෙන් උගේ කකුල වෙලුවාය.

"පුතා බයවෙන්න එපා දවස් කීපෙකින් කොබෙයියා සනීප වෙයි, උඟ පෙට්ටියෙන් තියලා පොත් වල වැඩ කරන්න□ අම්මා කීවාය. දිනපතා කොබෙයියාට කෑම සහ වතුර දීමට මම අමතක නොකළෙමි. අපේ අම්මා නිතරම උඟ ගැන සොයා බැලුවාය. දින කීපයක් ගත විය. පාසල් ගිය ද විටින් විට කොබෙයියා මගේ මතකයට නැගේ. පාසල ඇරී ගෙදර පැමිණි විගසම මම එයා ලගට ගියෙමි. පෙට්ටියෙන් එළියට පැමිණ හෙමින් හෙමින් ඇවිද යන කොබෙයියා මම දුටුවෙමි.

"අම්මේ ඉක්මනට එන්න□ මම කෑ ගැසුවෙමි.

"මොකද? අම්මා ඇසුවා ය.

"මේ බලන්නකෝ මෙයා ඇවිදිනවා''
දරාගත නොහැකි සතුටින් මම උඩ පැන්නෙමි.



අම්මාගේ මුහුණ ද සතුටින් පිරී තිබිණ. ඇය කොබෙයියා අතට ගෙන කකුලේ බැඳ තිබූ රෙදි පටිය ගැලෙව්වාය. ඉන්පසු කොබෙයියා බිමින් තැබුවාය. මඳ වේලාවක් අප දෙස බලා සිටි උඟ පෙට්ටියට පියෑඹුවේය.

තාත්තා වැඩ ඇරී එනවිට කොබෙයියාට කූඩුවක් ගෙනාවේය. කොබෙයියා දුටු තාත්තාට දැඩි සතුටක් දැනිණ. තාත්තා කොබෙයියා කූඩුවට දමා අඹ අත්තක එල්ලුවේය. අම්මා පොඩි තැටියකට හාල් ටිකක් දමා කූඩුවෙන් තැබුවාය. කොබෙයියා කූඩුව තුල ඇවිදිමින් හාල් කෑවේය. අපි කූඩුවේ දොර ඇර තබා නිවසට ආවෙමු.

දින කිහිපයකින් අපට අගෝස්තු නිවාඩුව ලැබිණ. දැන් කොබෙයියා කූඩුවෙන් පිටතට පැමිණ පියාසර කරයි.උගේ වර්ගයා නැවතත් කොබෙයියා ළඟට පැමිණෙති. රංචුවත් සමඟ කොබෙයියා ඈතට පියඹා යයි. කූඩුව ලඟට ඒමටද උඟ අමතක කළේ නැත. සෙනසුරාදා තාත්තාත් අම්මාත් මමත් මාමලාගේ ගමට යාමට පිටත් වූයෙමු. ගමේ අයියලා සමග සෙල්ලම් කිරීමට මට හැකිය. මේ පරිසරයට ද මා ඉතා කැමතිය.

ඉරිදා උදේ අම්මා තාත්තා ආපසු ගෙදර ගියද මම ගමේ නැවතුනෙමි. අයියා සමග වෙලේ සරුංගල් යවමින්, පාර දිගේ බයිසිකල් පදිමින් සතියක් ගත කෙළෙමි.

නැවත නිවසට පැමිණි පසු මම කොබෙයියාගේ කූඩුව දෙස බලමින් අඹ ගස වටා කැරකුනෙමි.ඒත් කොබෙයියා පේන තෙක් මානයක නැත. මට පාළුවක් සහ දුකක් දැනිණ.මම "කුකුරු කුං කුංග කියමින් කෑ ගැසුවෙමි. එත් කොබෙයියා ආවේ නැත.

අලුත් පාසල් වාරය ඇරඹිණි. කාලෙකින් යහළුවන් මුණගැසීම මට සතුටකි. සවස දෙකට පාසල ඇරී මම ගෙදර ආවෙමි. ඇඟ සෝදාගෙන තුවාය අව්වට දැමීමට මම එළියට ගියෙමි. සුපුරුදු හඬක් ඇසී මම ඒ දෙසට දිව ගියෙමි.

මා දුටු දසුනින් මට නිම්හිම් නැති සතුටක් දැනිණි,මම මහා හඬින් අම්මාට කගැසුවෙමි,අම්මා කලබලයෙන් මිදුලට ආවාය.

"ඇයි පුතා ඇයි'' අම්මා ඇසුවාය.
"අම්මා අර, කොබෙයියා අන්න කූඩුවට ඇවිත්.'' මම සතුටින් උඩ පැන්නෙමි.

අම්මාගේ මූණද සතුටින් පිරිණ. ඇය හාල් මිටක් ගෙනැවිත් කූඩුවේ තැටියට දැම්මාය.කොබෙයියා මා දෙස බලමින් හාල් ටික ගිල දැම්මේය. ඔයා ගියාට කමක් නෑ ,අපි බලන්න එන්න ඕන'' මම කොබෙයියාට ආදරයෙන් කීවෙමි.



මම උදෑසන අවදි වූ විගස හාල් ටිකක් කොබෙයියාගේ තැටියට දැමීමට අමතක නොකලෙමි.සමහර දිනවල අම්මා අඹ කෑල්ලක් හෝ පැපොල් කෑල්ලක් කූඩුව තුළට තැබුවාය.

එදා පාසල ඇරී මම නිවසට පැමිණියෙමි. ගේට්ටුව අරිනවාත් සමගම "කුකුරු කුං කුං'' කියමින් කොබෙයියා හඬ නැගුවේ මම මෙහේ කියන්නාක් සේය. මම සතුටින් දිව ගියෙමි. කෑම පෙට්ටියේ ඉතිරි වී තිබූ බත් ටික උගේ පිඟානට දැමුවෙමි.උඟ සතුටින් එය ගිල දැම්මේය.

මේ සිදුවීම දිනපතා පාසල් ඇරී එන විට සිදුවේ.අපි දැන් හොඳම යහළුවෝ වෙමු. ඉඩ ලැබෙන හැම මොහොතකම මම අඹ ගස යටට යමි. දිනක් මම අඹ ගස යටට යන විට අඹ අත්තක කූඩුවක් තිබෙනු දුටුවෙමි. එවිටම හොටෙන් කෑම ටිකක් ගෙන කොබෙයියා කූඩුව අසලට පැමිනියේය.කූඩුව දෙසින් කිචි බිචි හඬක් ඇසිණ .පුංචි කුරුළු හොටවල්ද මම දුටුවෙමි.මට ලොකු සතුටක් දැනිණ. මගේ යහළුවා තාත්තා කෙනෙක් වෙලා. දැන් මට යාලුවෝ ගොඩක්. මෙසේ සිතමින් මම කුස්සියට ගොස් ලොකු අඹ කෑල්ලක් ගෙනවිත් කූඩුව තුළ තැබුවෙමි.




එච්.පී. තමිදු පද්මීර